# ප්‍රවෘත්ති නිවේදනය

**ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2015 හතරවන කාර්තුව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**NR/DIV 9/3/2016/PRESS 6 ටෙලි: 011-2877959 ෆැක්ස්: 011-2147447 2016, මාර්තු 29**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රැකියා නියුක්තිය, රැකියා වියුක්තිය හා ශ්‍රමබලකාය වැනි සංඛ්‍යාති රසක උපනතිය පිළිබඳ කාලීන දත්ත ඉදිරිපත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය පවත්වනු ලබයි. මෙම සමීක්ෂණය 1990 වසරේ සිට කාර්තුමය පදනමක් යටතේ වාර්ෂිකව පවත්වාගෙන යනු ලබයි. 2015 වර්ෂයේදී පැවැත්වූයේ එම සමීක්ෂණ මාලාවේ 35 වැන්නයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවාස ඒකක 6250ක නියැදියක් භාවිතයෙන් 2015 හතරවන කාර්තුව සඳහා ශ්‍රමබල සංඛ්‍යාති නිකුත් කර ඇත. එම කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු 2015 ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස වල මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 15ට වැඩි ජනගහනය වැඩකරන වයසේ පසුවන ජනගහනයයි. වැඩකරන වයසේ ජනගහනය අතරින් සලකනු ලබන යොමු කාලය තුල රැකියාවක නියුක්ත හෝ රැකියාවක් නොකළ මුළු ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය වේ. 2015 හතරවන කාර්තුවට අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 8.9 ක් පමණ වේ. ඉන් 64.5 ක ප්‍රතිශතයක් පිරිමි ජනගහනය වන අතර 35.5 ක ප්‍රතිශතය ගැහැණු ජනගහනය වේ.

වැඩකරන වයසේ පසුවන ජනගහනය අතරින් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය ශ්‍රමබලකාය ලෙස හඳුන්වනු ලබයි. ශ්‍රමබලකායට අයත් වන පුද්ගලයින් සංඛ්‍යාව වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය ලෙස හඳුන්වනු ලබයි (LFPR). 2015 හතරවන කාර්තුවට අදාල සමීක්ෂණ ප්‍රතිපල වලට අනුව සමස්ථ ශ්‍රමබල සහභාගිතා අනුපාතය 53.6 ක් වන අතර ඉන් 75.4 ප්‍රතිශතයක් පුරුෂයින්ද 35.2 ප්‍රතිශතයක් ස්ත්‍රීන්ද වේ.

පුද්ගලයෙකු අදාල යොමු කාලය තුල අඩුම තරමින් පැයක්වත් වැටුප් ලබන සේවකයෙකු, සේවායෝජකයෙකු, තමගේ වැඩ කටයුතු කරන්නෙකු හෝ පවුලේ ආර්ථිකයට දායකවන්නෙකු ලෙස කිසියම් වැඩක නිරතවුණු පුද්ගලයෙකු රැකියා නියුතු පුද්ගලයෙකු ලෙස නම් කරයි. මෙම කාර්තුව සඳහා ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයින් ප්‍රමාණය මිලියන 8.6 ක් වේ. ඒ අතරින් 47.2%ක් සේවා අංශයේ ද 27.5%ක් කෘෂිකාර්මික අංශයේ ද 25.3%ක් කර්මාන්ත අංශයේද නිරත වී ඇත. ඉහලම සේවා නියුක්තියක් සේවා අංශයේ දක්නට ලැබෙන අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවයටම එම රටාව දක්නට ලැබේ. කාර්මාන්ත අංශයේ නියෝජනය අවම අගයක් ගනී. තවද 68%ක ප්‍රතිශතයක් සතියකට පැය 40කට වඩා වැඩ කර ඇති බව වාර්තා වී ඇත.

අදාල යොමු කාලය තුල රැකියාවක් නොමැතිව, පෙර සති 4 තුල රැකියාවක් සොයමින් සිටි , රැකියාවක් සෙවීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගත් හා ඉදිරි සති 2 තුල රැකියාවක් ලැබුණ හොත් එය කිරීමට හැකියාවක්ද ඇති පුද්ගලයින් රැකියා විරහිත පුද්ගලයින් සේ සලකනු ලබයි. මුළු රැකියා විරහිත පුද්ගලයින් ප්‍රමාණය, ශ්‍රමබලකායේ ප්‍රතිශතයක් ලෙස රැකියා විරැකියා අනුපාතය ලෙස හඳුන්වනු ලබයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතා ප්‍රකාශකර සිටියේ 2015 හතරවන කාර්තුවේදී ඇස්තමේන්තුගත රැකියා වියුක්ති අනුපාතය 4.3 % වන බවයි. තවද 2015 තුන්වන කාර්තුවේදී එම අනුපාතය 5.0% පමණ වූ බව ඔහු ප්‍රකාශ කර සිටී.